**කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2022**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ (“විද්‍යායතනය”) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | --------------- | ------------------ | ----------------------- | ------------ |
| (අ) | ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 571 | විද්‍යායතනයේ ආපසු ගෙවිය යුතු වර්ෂ 2ක් ඉක්මවූ එකතුව රු.766,765ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පතු සිසුන්ගේ ඉල්ලීම මත මුදාහරිනු ලබයි. පාඨමාලා සම්පූර්ණ කිරීමට අවුරුදු කිහිපයක් යන අතර ඒ නිසා මෙම තැන්පතුව විටින්විට අවුරුදු කිහිපයකට පසු ලබාදීමට කටයුතු කිරීමක් සිදු වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 880 | රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩුබාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩුබාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාල වුවත් | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, ඇප ආඥා පණතට අනුකූලව ඇප මුදල් තැන්පත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත්, එලෙස කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.26,850,988 ක වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | 2017-2022 වර්ෂවල ස්ථාවර වත්කම් - ලේඛණය දැනටමත් පිලියෙල කර ඇති අතර 2014-2016 වර්ෂවල ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කරමින් සිටින බව. | භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරන රාජය ව්‍යාපාර චක්‍රලේඛය | ගිණුම් වර්ෂය අවසන් වී දින හැට (60)ක් අතුළත වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත්කල යුතු වුවත්, විද්‍යායතනය විසින් 2022 ගිණුම් වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2023 අප්‍රේල් 27 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,164,355 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 515,696 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 648,659 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සේවක පිරිවැය, සැපයුම් වියදම් සහ සේවා වියදම් වල වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට හෙක්ටයාර් 5.41 ක් වූ භූමිය තුළ විද්‍යායතනය පිහිටුවා වසර 7 කට වැඩි කාලයක් ගතවී තිබුණද අදාල භූමිය විද්‍යායතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩමේ අයිතිය පවරා ගැනීම සම්බන්ධයෙන් දැනටමත් නිපුණතා සංවර්ධන අමාත්‍යංශයට හා ජනාධිපති කොමිසමටද කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් තුමා වෙතද දන්වා යවා ඇති බව. | විද්‍යායතනය ස්ථාපිත කර ඇති භූමියේ අයිතිය විද්‍යායතනය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පාඨමාලා සඳහා ලියාපදිංචි වන සිසුන් විසින් පාඨමාලාව නිමකල යුතු කාලපරිච්ඡේදය, විභාග සමත් විය යුතු වාර ගණන හා විභාග අසමත් වීම හෝ විභාගයන්ට පෙනී නොසිටීම හේතුවෙන් ශිෂ්‍යභාවය අවලංගු වීම පිළිබඳව නිසි මාර්ගෝපදේශයන් හඳුනාගෙන නොමැති වීම හේතුවෙන් විද්‍යායතනයේ අධ්‍යයන කටයුතු ආරම්භ කළ 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ලියාපදිංචි සිසුන් 782 දෙනෙකු අතරින් පාඨමාලාවන් සාර්ථකව නිම නොකරන ලද සිසුන් 315 දෙනෙකු වර්තමානය දක්වාම ආයතනයේ පාඨමාලා හදාරන සිසුන් ලෙස හඳුනාගෙන තිබුණි. | දැනට එම සිසුන් නැවත විභාගවලට පෙනී සිට තම පාඨමාලව සාර්ථක කර ගැනීම කටයුතු කරමින් පවතින බව. | පාඨමාලාවන්ට අදාලව නිශ්චිත මාර්ගෝපදේශයක් හඳුන්වා දී ඒ අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පාඨමාලා කාලය අවසන් වී ඇති 2015 සිට 2018 අධ්‍යයන වර්ෂය දක්වා එක් එක් පාඨමාලාවන්හි කාර්යසාධනය අනුව පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් අතරින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඩිප්ලෝමා සහතිකය හෝ ලබාගෙන ඇති ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 50 කටත් වඩා අඩු පාඨමාලා 21ක් පැවතුණි. | විභාග ප්‍රතිඵල වැඩිකර ඩිප්ලෝමා සහතික ලබාගැනීමේ ප්‍රතිශතය වැඩිකර ගැනීමට විවිධ කටයුතු සැලසුම් කර ඇති බව. | පාඨමාලා සාර්ථකව නිම කිරීමට අවශ්‍ය මඟපෙන්වීම හා අධීක්ෂණය සිසුන් වෙත සැපයිය යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 04 ඡේදය ප්‍රකාරව පාර්ලිමේන්තු පනත් මඟින් සංස්ථාපිත අධ්‍යාපන ආයතන ව්‍යවස්ථාපිත පනතේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | උපදෙස් පරිදි, ඉදිරියේදී සකස් කිරීමට නියමිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට අවශ්‍යය කටයුතු සම්පාදනය කරන බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |